# සමාජයේ සංස්කෘතික සට්ටනය මතින් අපට අහිමිවන සාම්ප්‍රාදායික බෙර කර්මාන්තය ;කූරගල ගම්මානය ඇසුරින් විමර්ශනය.

එච්.ඒ.එච්. මදූසංඛ, බී.එල් චතුරිකා*

ශ්‍රී ලාංකීය මානව අනන්‍යතාව පිළිබිඹු කරන මාධ්‍යක් ලෙසින් මෙරට සාම්ප්‍රදායික කර්මාන්ත පෙන්වා දිය හැකිය. එවැනි කර්මාන්ත අතර '' වේවැල්, රෙදි, සේසත් සහ බෙර'' ආදිය පෙන්වාදිය හැකිය. සමාජය තුළ මෙවැනි කර්මාන්තයන්හි නියැලෙන විවිධ කුල දක්නට ලැබේ. එම කුල අතර රොඩී කුලය ද එකකි. සමාජය තුළ කර්මාන්තය අනුව තමන් පහත් යැයි පවතින සමාජ පිළිගැනීම මත ඔවුන්ගේ විවිධ සංස්කෘතිකාංග හා අනෙකුත් විවිධ සාම්ප්‍රදායික කර්මාන්ත තුළින් ඇත් වීමේ ස්වභාවයක් දක්නට ලැබේ.

මෙහි අරමුණ වන්නේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කූරගල ගම්මානයේ අභාවයට යමින් පවතින සාම්ප්‍රදායික බෙර කර්මාන්තය පිළිබඳව විමර්ශනය කිරීමයි. එහිදී ක්ෂේත්‍ර අධ්‍යයනයට පිවිසීමට පෙර ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්ත හා කුල ක්‍රමය පිළිබඳව පුස්තකාල අධ්‍යනය කිරීමත්,අනතුරුව ක්ෂේත්‍ර අධ්‍යනය කිරීමත් සිදු කෙරිණ. අතීතයේ පටන් මහනුවර ශ්‍රී දළදා මාලිගයටත්, කතරගම පෙරහැර මංගල්‍යයටත් බෙර සපයා ඇත්තේ මෙම ගම්මානයෙනි. නමුත් වර්තමානය වනවිට කුලය මත අතහැරෙන කර්මාන්තයක් බවට මෙය පත්ව තිබීම අභාග්‍යයට කරුණකි. එහිදී ඔවුන්ට අනන්‍යව තිබූ අර්ථ ක්‍රම, ඇදහිලි විශ්වාස, චාරිත්‍ර විධි, නීති ක්‍රම ආදී සංස්කෘතිකාංග වෙනස් වී ඇති බව හඳුනාගත හැකිය. මෙම සමාජ වෙනස්වීම් හරහා සමාජයේ සමතාවක් ලබා ගැනීමට කෙමෙන් මොවුන් සමත්ව තිබෙන අතර, මෙතෙක් ඔවුන් පවත්වාගෙන පැමිණි සාම්ප්‍රදායික සංස්කෘතිය හා කර්මාන්ත යන අංශ දෙකම බිඳ වැටීමේ තත්ත්වයකට ලක්ව ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද; කූරගල, සමාජ සම්ප්‍රදාය, සංස්කෘතිය, බෙර කර්මාන්තය, රොඩී කුලය.

* පුරාවිද්‍යාව අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. hapugalamadu92@gmail.com liyanagechathurika9@gmail.com